III වගඋත්තර 12 (1)


**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022-11-22 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය :- ටී.ටී වසන්ත කුමාර මහතා,
පැරණි යුධ හමුදා කඳවුර,
ග්‍රාම 06, මුවංගල.

වගඋත්තර පාර්ශවය :-

01. ප්‍රාදේශීය ඉංජිනේරු,
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,
අම්පාර.

02. විධායක නිලධාරී,
ගල්ඔය වැව්ලි සමාගම,
හිඟුරාණ.

03. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සම්මන්තුර.

04. අධ්‍යක්ෂ,
වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය,
අම්පාර.

05. ග්‍රාම නිලධාරී,
89/බී, වලතාපිටිය 01,
සම්මන්තුර.

<u>පැමිණිලි අංකය :-</u> **<u>HRC/AM/59/18/B/LP</u>**

**පැමිණිල්ලේ සැළකිරීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් තමන් ගල්ඔය රක්ෂිතයේ වැලි ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා නීත්‍යානුකූලව අදාළ ආයතන වල නිර්දේශ


| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary: 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996 | වෙබ් / இணையம் / Web: www.hrcsl.lk |

ලබාගෙන භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය වෙතින් 2018 ජුනි 13 වන දින සිට බලාත්මක වන පරිදි දින 45 ක කාලයක් සඳහා A2/A/AMP/586 ( ගංගා වැලි ) කැනීමේ බලපත්‍රය ලබාගත් බව දක්වා ඇත.

අදාළ බලපත්‍රයට අනුව 2018.06.13 වැලි ගොඩ දැමීමේ කටයුතු ආරම්භ කළ බවත්, එදිනම ගල්ඔය වැවිලි සමාගමේ ක්ෂේත්‍ර නිලධාරීන් පැමිණ එම කටයුතු නතර කර අදාළ ඉඩම් එම සමාගමට අයත් ඉඩම් බව පවසා අම්පාර පොලිස් ස්ථානයට පැමිණිලි කර වැලි ගොඩ දැමීම නැවැත්වීමට කටයුතු කළ බවත් දන්වා ඇත. 2018 ජූලි මස 27 වන දින වැලි තොටුපලට ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීමට යාමේදීද නැවත එම ක්‍රියාවද නැවැත්වූ බවත් දන්වා ඇත.

තමන් වැලි තොටුපල සඳහා බලපත්‍රය ලබාගත්තේ ගංගා රක්ෂිතය සඳහා බවත්, ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේද නිර්දේශ ලබා දී තිබියදී තම ව්‍යාපාරික කටයුතු නිදහස්ව සිදු කරගෙන යාමට ඉඩකඩ අහුරාලීම තුළ තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බවත් පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

ගල්ඔය වැවිලි සමාගම 2018.10.04 දිනැතිව කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් පැමිණිලිකරු සඳහන් කරන ඉඩම් කැබැල්ල රජය විසින් නම් කොට ඇති අංක G/163/RR/08 යන උක් වගාව සඳහා පමණක් වෙන් කොට ඇති මොලවිල්ලාරු ප්‍රදේශයේ පිහිටි සම්මන්තුර දෙමළ ප්‍රදේශයේ එස්.කනපති නමැති අයට උක් වගාව සඳහා නීත්‍යානුකූලව ලබා දී ඇති ඉඩමක් බව සඳහන් කර ඇත. හිඟුරාණ සීනි සමාගමේ සාමාන්‍යාධිකාරී 2013.09.05 දිනැතිව එවා ඇති ලිපිය අනුව එය පසුකාලීනව සම්මන්තුර, 04 වන වීදිය ,නො. 85/1-1 හි පදිංචි ඊබ්‍රාහිම් ලෙබ්බේ නාහීර් යන අයට තාවකාලිකව ලබා දී ඇති බවත්, දැනට එම ඉඩමේ පැරණි වලතාපිටිය, නො.99 පදිංචි එස්.තුරෙයිසිංහම් නැමැති ගොවි මහතා, ගල්ඔය වැවිලි සමාගම සමඟ ගිවිසුම්ගතව උක් වගාව කරගෙන යන බවද පවසා ඇත.

එසේම පැමිණිලිකරු මෙම ඉඩමේ වගාව විනාශ කරමින් එම ඉඩම හරහා ගං ඉවුර වෙත මාර්ගයක් සෑදීමටත් උත්සාහ කිරීම ආයතනයේ කලාප භාර නිලධාරීන් විසින් පොලිස් සෝදිසි ඇමතුම් අංශය වෙත පැමිණිලි කර නවතා දැමීමට කටයුතු කර ඇති බවත්, පැමිණිලිකරු වෙත භූ විද්‍යා හා පතල් කාර්යාංශය විධිමත් ප්‍රවාහන මාර්ගයන් සකසා ගත නොහැකි ස්ථානයක් සඳහා වැලි කැනීම් බලපත්‍රයක් නිකුත් කර ඇති බවත්, එය කෙසේ සිදුවී දැයි යන්න හා ප්‍රශ්ණගත ඉඩමට වන හානිය වැළැක්වීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලෙසද ඉල්ලා ඇත. එසේම තමන් පැමිණිලිකරුට අලාභයක් කිරීමේ අරමුණින් කටයුතු කර නොමැති අතර, හුදෙක් සීනි නිශ්පාදනය සඳහා භාවිතයට ගැනීමට වගා කොට ඇති උක් වගාවට සිදු වූ හානිය වළක්වා ගැනීමේ අරමුණින් කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

ප්‍රාදේශීය ලේකම් සම්මන්තුර 2018.10.10 දිනැති LAN/SANS/5/2017 (43) අංක දරණ වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින්, පැමිණිලිකරු වලතාපිටිය ප්‍රදේශයේ වැලි තොටුපලක් පවත්වාගෙන යාම සඳහා

ග්‍රාම නිලධාරී හා ඉඩම් නිලධාරී නිර්දේශ සහිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කර තිබූ බවත්, එම ඉල්ලීම අනුමැතිය ලබා දීම පිණිස තමාගේ නිර්දේශයද සමඟ 2017.10.30 දිනැති ලිපිය මඟින් භූ විද්‍යා හා පතල් කාර්යාංශය වෙත 2017.11.13 වන දින මධ්‍යම පරිසර අධිකාරිය, අම්පාර වෙත එවා ඇති බවත් දන්වා ඇත.

වාරිමාර්ග අධ්‍යක්ෂ, අම්පාර 2018.10.20 දිනැති AM/DI/E/HR/AM/02 අංක දරණ වාර්තාව මඟින් පැමිණිලිකරු වෙත සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වලතාපිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගල් ඔය ගඟ ආශ්‍රිතව ($7^{0}16$ $16^{0}7$” W/$81^{0}$ 43” 192”E) නව වැලි කැනීම් ව්‍යාපෘතිය සඳහා ස්ථාන පරීක්ෂාවක් සිදු කර භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයට නිර්දේශ ලබා දී ඇති බව දන්වා ඇත.

එයට අමතරව ගල් ඔය ගඟ දෙපස වාරි රක්ෂිතය පිළිබඳව පහත පැහැදිලි කිරීම සිදු කර ඇත.

01. ගල්ඔය ගඟ රක්ෂිතය, ගල්ඔය වැව්ලි සමාගම වෙත වෙන් කර දී ඇති බව සඳහන් ලියකියවිලි හා ගිවිසුමේ නම කාර්යාලය සතුව නොමැති බව දන්වා ඇත.
02. වාරි මාර්ග දෙපාර්තමේන්තුව චක්‍රලේඛ අංක/08/2014 (Assets Managements) අනුව පළල 15mට වඩා වැඩි වූ ප්‍රධාන ගංගා වල රක්ෂිතය ඉවුරේ සිට 60m දක්වා දෙපසටම වන බවත්, දන්වා ඇත.
03. 2006 ජුලි 27 වන දින පළමු අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළමු ජාතික පාරිසරික පනත් අංක 47-1980 අනුව 25mක් ඉක්මවා යන, ගංගාවක් සඳහා රක්ෂිතය ඉවුරේ සිට 60m ලෙස අර්ථ දක්වා ඇති බවත් දන්වා ඇත.
04. රජයේ ඉඩම් ආඥා පනත Land ordinance (chapter 454) අනුව 25m කට වැඩි පළල ඇති ගංගාවක රක්ෂිත ඉවුරේ සිට 60m ලෙස දක්වා ඇති බව දන්වා ඇත.
05. රජයේ රක්ෂිතයක හෝ රක්ෂිත කොටසක පුද්ගලික ව්‍යාපෘති කිරීම සඳහා ජාතික පාරිසරික පනත අනුව අනුමැතිය ලබා තිබිය යුතු බැවින් එම ආයතනයන්ගෙන්ද වැඩිදුර විස්තර ලබා ගැනීම සුදුසු වන බවටද දන්වා ඇත.
06. ගංගා රක්ෂිතය වැව්ලි සමාගම් සතු බවට එම සමාගම ප්‍රකාශ කරන්නේ නම්, අදාළ ලියකියවිලි හා ගිවිසුම් ලබා ගැනීමෙන් පසුව ඒවා අධ්‍යනය කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කිරීම උචිත බවද දන්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු සහ නිරීක්ෂණ:-**

පැමිණිලිකරු වෙත භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශය විසින් 2018 ජුනි මස 13 වන දින සිට බලාත්මක වන පරිදි දින 45ක කාලයක් සඳහා A2/A/AMP/586 (ගංගා වැලි ) අංක දරණ නීත්‍යානුකූල කැනීම් බලපත්‍රය නිකුත් කර ඇති බව අනාවරණය වේ.

අදාළ වැලි බලපත්‍රය සඳහා වැලි කැනීම් කර ගබඩා කිරීම හා මාර්ග පහසුකම් සපයා ගැනීමට යෝජිත භූමිය සඳහා හිඟුරාණ සීනි සමාගම ජී/163/RR/08 දරණ ඉඩම ලෙස නම් කර උක් වගාව සඳහා පමණක් එස්. තුරෛසිංගම් වෙත පවරා ඇති අතර , ඔහුගේ ඉල්ලීම මත එම පදනම මතම සම්මන්තුර වීරමුනේ වී.සී. කෝවිල්

පාරෙහි පදිංචි සලමන් කරුණාවතී වික්ටෝරියා වෙත 2011.03.20 වන දින භාරකාරත්වය පවරා දී ඇත. ඇයගෙන් පැමිණිලිකරු එය මුදල් ගෙවා ලබා දී ඇති බව අනාවරණය වේ.

ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අදාළ ඉඩම ගංගා රක්ෂිතයට හසුවන සේ වාරි මාර්ග දෙපාර්තමේන්තුව මායිම් කණු යොදා (පැමිණිල්ල පිළිබඳව කළ පරීක්ෂණයේදී) ගල්ඔය ගඟේ රක්ෂිතය මායිම් කර ඇති බව අනාවරණය වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව දක්වා ඇති පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 18/28/41 ජාතික පාරිසරික පනත් අංක 47-1980 ( 2006 ජුලි 17 පළ වූ අතිවිශේෂ ගැසට් නිවේදනය ) හා රජයේ ඉඩම් ආඥා පනත අනුව 15m හා 25m පළල ගඟක රක්ෂිතය ඉවුරේ සිට දෙපැත්තට 60m වේ. ඒ අනුව හිඟුරාණ සීනි සමාගම අංක කොට ඇති G/163/RR/08 ඉඩම් කොටස ගංගා රක්ෂිතයට අයත් බව අනාවරණය වේ.

අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂකගේ වාර්තාව අනුව ගල්ඔය වැවිලි සමාගම වෙත ගල්ඔය ගඟ රක්ෂිතය වෙන් කර දී ඇති බව සඳහන් ලියකියවිලි හා ගිවිසුම් අම්පාර වාරි මාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ නොමැති බව අනාවරණය වේ. අදාළ ගිවිසුම් හා ලියකියවිලි පිටපත් පැමිණිල්ලේ විමර්ශණ සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලයට ලබා දෙන මෙන් විධායක නිලධාරි ගල්ඔය වැවිලි සමාගම වෙත 2019.03.11 හා 2019.04.10 දැන්වූවද, ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් එම සමාගම සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු වැලි කැනීම් බලපත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් පරීක්ෂණ ගාස්තු ,රාජ්‍ය භාගය, කැනීම් ගාස්තු, ප්‍රවාහන ගාස්තු රජයට ගෙවා ඇති නමුත්, ඔහුගේ බලපත්‍ර කාල සීමාව නිමා වන තෙක් ඔහුට වැලි කැනීම් සිදු කිරීමට අවස්ථාව ලැබී නොමැති බව අනාවරණය වී ඇත.

අදාළ බලපත්‍ර නිකුත් කිරීමේදී බලපත්‍ර සඳහා ප්‍රවේශ මාර්ගය හා වැලි ගබඩා කිරීම් කරනු ලබන ඉඩමේ අයිතිය සම්බන්ධ සීනි සමාගම කරුණු ඉදිරිපත් කර නොතිබූ බැවින් එම බලපත්‍රය ලබා දීමට ආදේශ කළ බව ග්‍රාම නිලධාරි, ඉඩම් නිලධාරි, ප්‍රාදේශීය ලේකම් , පරිසර අධිකාරිය ,භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කොමිෂන් සභාවේදී කරුණු දක්වා ඇත.

මේ අනුව පැමිණිලිකරු වැලි කැනීමේ බලපත්‍රය ඉල්ලා ඇති බිම් කොටස වාරි මාර්ග දෙපාර්තමේන්තුව සතුව ගල්ඔය වාරිරක්ෂිතයට අයත් ඉඩම් කොටසක් බව අනාවරණය වන නමුත් ඒ සඳහා හිඟුරාණ සීනි සමාගම G163/RR/08 දරණ බලපත්‍රයක් නිකුත් කර ඇති බව අනාවරණය වේ. එහිදී RR යනු River Reserve ලෙස පැමිණිල්ල කරුණු දක්වා ඇත. ඒ අනුව අදාළ රක්ෂිතය වගා බිමක් ලෙස පවත්වාගෙන යාමට ජාතික පාරිසරික පනත අනුව අනුමැතිය ලබා තිබිය යුතුය. එසේ වුවද, එවැනි අනුමැතියක් ලබාගෙන ඇති බවට හෝ ලියවිලි කිසිවක් ඉදිරිපත් කිරීමට ගල්ඔය වැවිලි සමාගම අසමත්ව ඇත. ඒ අනුව අදාළ බිම් කොටස වාරි මාර්ග රක්ෂිතයට අයත් ගල්ඔය වැවිලි සමාගම අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් කොටසක් ලෙස නිගමනය කළ හැකි බව පෙනේ. ඒ අනුව ගල්ඔය ගඟ රක්ෂිතයට අයිතිවාසිකම් කියමින් පැමිණිලිකරුට ඒ හරහා වැලි ප්‍රවාහනයට ඉඩ නොදීම නීති විරෝධී ක්‍රියාවක් බව කොමිෂන් සභාවේ නිරීක්ෂණය වන අතර, එමගින් පැමිණිලිකරුට 1978

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන ඡේදයේ 12 (I) ව්‍යවස්ථාවෙන් හිමිව ඇති මූලික අයිතිවාසිකම් පැමිණිලිකරු විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන ඡේදයේ 12 (I) ව්‍යවස්ථාවෙන් හිමිව ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලි පාර්ශවය වෙත අදාළ ස්ථානයේ වැලි කැනීම් කිරීම සඳහා ලබා දී ඇති අවලංගු බලපත්‍රයේ ඇති දින 45 ක කාලය සඳහා බලපත්‍ර කොන්දේසි අනුව වැලි කැනීම් කිරීමට අවස්ථාව සලසා දිය යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.12.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
සභාපතිනී,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)

Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත් :- 01. අමාත්‍යතුමා,
පරිසර අමාත්‍යාංශය,
'සොබාදම් පියස'
416/C/1, රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

02. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය,
මානව හිමිකම් කොමිෂන් සභාව.

B/-